සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

| 32 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# ව්‍යාපාර අධ්‍යයනය I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු අදාල තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමිවේ.

01. කාර්මික විද්‍යාලයේ 13 ශ්‍රේණියේ ඉගෙන ගන්නා දිල්ෂාන් පාසල තුළදී හදිසියේ අසනීප වීමෙන් විදුහල්පතිතුමා විසින් ඔහු රෝහල වෙත යොමුකර ඇත. මෙම තත්ත්වය තුළ වඩාත්ම ගැළපෙන දිල්ෂාන්ගේ මූලික අවශ්‍යතා ලෙස දැක්විය හැක්කේ,

1. අධ්‍යාපනය හා ආරක්ෂාව 2. අධ්‍යාපනය හා ප්‍රවාහනය 3. අධ්‍යාපනය හා සෞඛ්‍යය
4. සෞඛ්‍ය හා ආරක්ෂාව 5. සන්නිවේදනය හා ආදරය (...........)

02. පහත දැක්වෙන වගුවේ X තීරුවේ ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව සඳහන් වේ. Y තීරුවේ ඇල්ම දැක්වීමට හේතු සඳහන් වේ.

| X | E |
|---|---|
| 1. අයිතිකරුවෝ | A. සුබසාධන පහසුකම් |
| 2. සේවකයෝ | B. පොලී ලැබීම |
| 3. ණය සැපයුම්කරුවෝ | C. රැකියා අවස්ථා |
| 4. තරඟකරුවෝ | D. බදු ආදායම |
| 5. රජය | E. වර්ධනය |
| 6. සමාජය/ප්‍රජාව | F. මිළ ගණන් |
| 7. ගනුදෙනුකරුවෝ | G. ණය පහසුකම් |

X වගුවේ පාර්ශව වලට අනුව Y වගුවේ හේතු ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. 1B, 2A, 3E, 4C, 5D, 6G, 7F 2. 1E, 2A, 3B, 4F, 5D, 6C, 7G 3. 1E, 2A, 3B, 4F, 5C, 6D, 7G
4. 1D, 2F, 3B, 4F, 5C, 6E, 7A 5. 1A, 2B, 3D, 4C, 5E, 6F, 7F (...........)

03. I තීරුවෙහි අවශ්‍යතා කිහිපයක් හා II තීරුවෙහි වුවමනා කිහිපයක් පහත දැක්වේ.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සෞඛ්‍යය | A. බංගලාව |
| 2. ආහාර | B. ප්‍රථමාධාර |
| 3. ඇඳුම් | C. කිරි |
| 4. නිවාස | D. දේශන |
| 5. අධ්‍යාපනය | E. පාවහන් |
| 6. ආරක්ෂාව | F. රක්ෂණය |

I තීරුවෙහි අවශ්‍යතා II තීරුවෙහි වුවමනා සමඟ නිවැරදිව අනුපිළිවෙළට ගැළපූ විට දැක්වෙන පිළිතුර තෝරන්න.

1. F, C, E, A, D, B 2. B, C, E, A, F, D 3. B, C, E, A, D, F
4. B, C, E,A,F,D 5. F, C,E,A, B, D (...........)

04. ව්‍යාපාරවල ඓතිහාසික සංවර්ධනයේ වැදගත් අවස්ථා අනුපිළිවෙළින් දැක්වෙනුයේ,
1. ඍජු නිෂ්පාදනය/මුදල් භාවිතය / භාණ්ඩ හුවමාරුව / වෙළෙඳම / වාණිජ්‍යය / කාර්මික විප්ලවය / උපකාරකසේවා / විද්‍යුත් වාණිජ්‍යය / විද්‍යුත් ව්‍යාපාර.
2. ස්වයංපෝෂිත යුගය / අතිරික්ත නිස්පාදන බිහිවීම / භාණ්ඩ හුවමාරුව / වෙළඳම / මුදල් භාවිතය / උපකාරකසේවා ඇතිවීම / කාර්මික විප්ලවය සමඟ මහා පරිමාණ නිෂ්පාදනය / විද්‍යුත් වාණිජ්‍යය / විද්‍යුත් ව්‍යාපාර
3. කාර්මික විප්ලවය / ඍජු නිෂ්පාදනය / භාණ්ඩ හුවමාරුව / මුදල් භාවිතය / මහා පරිමාණ නිෂ්පාදනය / තොරතුරු තාක්ෂණය / වෙළඳාම / විද්‍යුත් වාණිජ්‍යය / විද්‍යුත් ව්‍යාපාර.
4. ස්වයංපෝෂිත යුගය / ඍජු නිෂ්පාදනය / වක්‍ර නිෂ්පාදනය / කාර්මික විප්ලවය / භාණ්ඩ හුවමාරුව / මුදල් භාවිතය / වාණිජ්‍යය/ විද්‍යුත් ව්‍යාපාර / තොරතුරු තාක්ෂණ යුගය.
5. භාණ්ඩ හුවමාරුව / මිළ ක්‍රමය / වක්‍ර නිෂ්පාදනය / වාණිජ්‍යය / විද්‍යුත් වාණිජ්‍යය / කාර්මික විප්ලවය / තොරතුරු තාක්ෂණය / විද්‍යුත් ව්‍යාපාර / දැනුම් පදනම් යුගය. (...........)

05. දළ දේශීය නිස්පාදිතයේ ආංශික සංයුතියෙහි ''කාර්මික අංශයට'' අයත් දෑ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. පශු සම්පත්/පතල්/නිෂ්පාදන කර්මාන්ත/ගෑස්/ජල සැපයුම
2. පතල්/නිවාස අයිතිය/නිස්පාදන කර්මාන්ත/ඉදිකිරීම්/දැව
3. ඉදිකිරීම්/නිමැවුම්/ධීවර/රබර් නිෂ්පාදන/සන්නිවේදනය
4. කැනීම්/විදුලිය/ගෘහ කර්මාන්ත/ජල සැපයුම/ඉදිකිරීම්
5. මිනිරන් කැනීම්/ඇගලුම් සැපයුම්/ධීවර/නිවාස අයිතිය/ඉදිකිරීම් (...........)

06. පහත ප්‍රකාශ අතුරින් ''වෙළඳම'' යන්න වඩාත් හොඳින් අර්ථ දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
1. මව තම දියණියගේ උපන්දිනයට සපත්තු ජෝඩුවක් ගෙනවිත් දීම.
2. බන්දු තම නිවසේ පරිභෝජනයටසහල් කිලෝ 5ක් මිළදී ගැනීම.
3. මාලා තම දියණියගේ පාසලේ උත්සවයකට අළුවා කෑලි 100ක් සාදා යැවීම.
4. අමර නිවසේ පරිභෝජනයට තම එළවළු කොටුවෙන් මාලු මිරිස් ග්‍රෑම් 500ක් ගෙන ඒම.
5. මිත්‍රපාලතමාට හිමි ඉඩම් කොටසක් තෑගි ඔප්පුවකින් පුතාට ලියා දීම. (...........)

07. ඉපැරණි සමාජයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක් තමා විසින් ම නිෂ්පාදනය කර සපුරාගත් බව සඳහන් වුවද වර්තමානයේ පුද්ගල අවශ්‍යතා හා වුවමනා බොහොමයක් වෙළඳ පොළෙන් භාණ්ඩ හා සේවා මිළට ගැනීමෙන් සපුරා ගනු ලබයි. එසේ වෙළඳපොළෙන් භාණ්ඩ හා සේවා මිළට ගැනීමට හැකිවී ඇත්තේ,
1. භාණ්ඩ හුවමාරුව නිසා ය. 2. ඇණවුමට නිෂ්පාදනය නිසා ය.
3. ඍජු නිෂ්පාදනය නිසා ය. 4. වක්‍ර නිෂ්පාදනය නිසාය.
5. ප්‍රාථමික නිෂ්පාදනය නිසාය. (...........)

08. ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික යන නිෂ්පාදිත අනුපිළිවෙළින් දැක්වෙන්නේ,
1. ධීවර, පතල්/ගොවිපොළ, ඉදිකිරීම්/වෙළඳම, ඍජු හා පුද්ගල සේවා
2. ගොවිපොළ, ධීවර/කැනීම්, ඉදිකිරීම්/වෙළඳාම, සන්නිවේදන
3. ගොවිපළ, පතල්/ඉදිකිරීම්, වෙළෙඳම/සන්නිවේදනය, ප්‍රවාහන
4. ගොවිපල, කැනීම් කටයුතු/ගැළපුම්, විදුලිය හා ජලය/වාණිජ්‍යය, උපකාරක සේවා
5. කැනීම් කටයුතු, ගොවිපළ/නිමැවුම්, ඉදිකිරීම්/උපකාරක සේවා, වෙළඳම (...........)

09. සාර්ථක ව්‍යාපාරිකයෙකු වීමට ව්‍යාපාර පරිසරය හොඳින් අධ්‍යයනය කළ යුතු වේ. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා දැක්විය හැකි අතර බාහිර පරිසරයේ කොටස් කිහිපයක් A වගුවේ ද ඒ ඒපරිසර කොටසෙහි අන්තර්ගත සාධක B වගුවේ ද දැක්වේ.

| **A (බලවේග)** | **B (සාධක)** |
|---|---|
| 1. ආර්ථික පරිසරය | a. අමුද්‍රව්‍ය හිඟය/ඉහළ බලශක්ති පිරිවැය/පරිසර දූෂණය |
| 2. ප්‍රජා පරිසරය | b. අණ පණත්/රජයේ ප්‍රතිපත්ති/අධිකරණය |
| 3. ස්වභාවික පරිසරය | c. සේවා වියුක්තිය/ගෙවුම් ශේෂය/උද්ධමනය |
| 4. දේශපාලනික පරිසරය | d. පර්යේෂණය හා සංවර්ධනය/විදුලි සංදේශනය/නව නිෂ්පාදන ක්‍රියාවලි |
| 5. තාක්ෂණික පරිසරය | e. ගෘහස්ථ රටා/වයස් ව්‍යුහය/අධ්‍යාපන මට්ටම |
| | f. පරිසර දූෂණය/දේශගුණික තත්ත්ව/ජනවර්ග |
| | g. උද්ධමනය/විනිමය අනුපාතය/වෘත්තීන් |

එක් එක් පරිසර බලවේගවලට අදාළ සාධක නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

1. 1-g, 2-e, 3-f, 4-b, 5-d. 2. 1-c, 2-e, 3-f, 4-d, 5-b 3. 1-g, 2-f, 3-a, 4-d, 5-b
4. 1-c, 2-e, 3-a, 4-b,5-d 5. 1-a, 2-b,3-c, 4-d, 5-e (...........)

10. ව්‍යාපාරවල ඇල්මැති පාර්ශව හා ව්‍යාපාරවලින් ඉටුවිය යුතු සමාජ වගකීම් කිහිපයක් පහත දැක්වේ.

| **පාර්ශව** | **සමාජ වගකීම්** |
|---|---|
| 1. රජය | e. පරිසර හානි අවම කිරිම. |
| 2. අයිතිකරුවන් | f. සාධාරණ ප්‍රතිලාභ සැපයීම. |
| 3. සේවකයින් | g. වෘත්තීය ආරක්ෂාව සැලසීම. |
| 4. ගනුදෙනුකරුවන් | h. භාණ්ඩ පිළිබඳ නිවැරදි තොරතුරු සැපයීම. |
| 5. ප්‍රාදේශීය ජනතාව | i. නිසි කලට බදු |
| 6. සැපයුම්කරුවන් | j. නියමිත වේලාවට ගෙවීම |

ඉහත 1, 2, 3, 4, 5 අංක වලින් දැක්වෙන පාර්ශව වෙනුවෙන් ව්‍යාපාරවලින් ඉටුවිය යුතු සමාජ වගකීම් පිළිවෙළින් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

1. e, f, g, h, e, j 2. i, f, g, h, e,j 3.j,f, g, h, e, i 4. g, f, h, j, e, i 5.e, f, g, i, j, h (...........)

11. රජය ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේදී යොදාගන්නා උපාය මාර්ගයක් වන්නේ,

1. කළමනාකරණ උපදේශන සේවා ලබාදීම. 2. ශිල්පීය දැනුම හා තාක්ෂණය ලබාදීම.
3. සේවකයන් පුහුණු කිරීම. 4. ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම.
5. වෙළෙඳපොල පහසුකම් ලබාදීම. (...........)

12. රජයක් ඉටුකර ගැනීමට කටයුතු කරන ආර්ථික අරමුණක් නොවන්නේ,

1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය. 2. සාධාරණ ආදායම් ව්‍යාප්තිය. 3. පූර්ණ සේවා නියුක්තිය.
4. දේශීය සම්පත් භාවිතය. 5. ආර්ථික ස්ථායිතාව. (...........)

13. පහත සඳහන් දෑ අතුරෙන් ගුණාත්මක ණය පාලන ක්‍රමයට අයත් වන්නේ,

1. වාණිජ බැංකු විසින් සපයන ණය සඳහා උපරිම පරිණත කාලයක් නියම කිරීම.
2. වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම.
3. ණය ලබාදෙන ක්ෂේත්‍ර නිර්දේශ කිරීම.
4. ණයවර ලිපි නිකුත් කිරීමේදී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම.
5. අලුතින් නිකුත් කරන ණය සඳහා උපරිම සීමා පැනවීම. (...........)

14. පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට අත්වන වාසියක් නොවන්නේ,
1. පාරිභෝගික සෞඛ්‍ය හා ආරක්ෂාව තහවුරු වීම.
2. වෙළඳ විෂමාචාරවලින් ආරක්ෂා වීම.
3. ගුණාත්වයෙන් යුත් භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනාගත හැකිවීම.
4. පාරිභෝගිකයාට ජීවත්වීමට සුදුසු පරිසර තත්ත්වයක් උදාවීම.
5. අවශ්‍ය අවස්ථාවලදී නීතිමය රැකවරණය ලබාගත හැකිවීම. (...........)

15. පාරිභෝගික වගකීම් **X** තීරුවෙන්ද, ඊට අදාළව පාරිභෝගිකයා සතුවූ කාර්යයන් **Y** තීරුවෙන්ද දැක්වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1) ගුණදොස් සෙවීමේ විචාරාතමක අවබෝධයයි. | A. යුක්ති සහගත හා සාධාරණ ගනුදෙනු සඳහා ක්‍රියාකාරීවීම සහ අයිතීන් ආරක්ෂා කරගැනීම. |
| 2) සහයෝගීතාව | B. පරිසරයට සිදුවන හානිය හා අනාගතයට අවශ්‍ය ස්වභාවික සම්පත් සංරක්ෂණයට පරිභෝජන රටාවන් පිළිබඳ අවබෝධය. |
| 3) ක්‍රියාකාරී සහභාගිත්වය | C. භාණ්ඩ හා සේවාවල ගුණත්වය මිල ප්‍රමාණ පිළිබඳ ප්‍රශ්න කිරීම. |
| 4) සමාජය ගැන සැළකිලිමත්වීම. | D. අපගේ පරිභෝජන රටාව අන් අයට කරන බලපෑම පිළිබඳ දැනුවත් වීම. |
| 5) පාරිසරික දැනුවත් බව. | E. පාරිභෝගික අයිතීන් ලබා ගැනීමට එක්ව සංවිධානය වීම. |

මෙම X හා Y තීරු දෙක නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,
1. 1-A, 2-C, 3-D, 4-E,5-B 2. 1-C, 2-E, 3-A, 4-D, 5-B 3. 1-C, 2-A, 3-E, 4-B, 5-D
4. 1-B, 2-D, 3-C, 4-E, 5-A 5. 1-C, 2-A,3-E, 4-D, 5-B (...........)

16. පෞද්ගලික ව්‍යාපාර සංවිධාන ගණයට ගැනෙන කේවල හා හවුල් ව්‍යාපාර යන දෙවර්ගයටම පොදු ආඥාපනතක් වන්නේ,
1. 1890 හවුල් ආඥා පනත. 2. 1840 වංචා වැළැක්වීමේ පනත
3. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥාපනත. 4. 1972 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පනත
5. 2007 අංක 07 දරණ පනත (...........)

17. හවුල් ව්‍යාපාරයක හවුල් කරුවන් තීරණය කරනු ලබන්නේ,
1. 1890 හවුල් ආඥාපනත. 2. 1840 වංචා වැළැක්වීමේ පනත 3. 1907 ආඥා පනත.
4. 2007 අංක 07 සමාගම් පනත 5. 1918 අංක 06 දරණ පනත. (...........)

18. පහත ප්‍රකාශ අතුරින් සීමිත පොදු සමාගමකට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
1). අවම අධ්‍යක්ෂකවරු එක් අයෙකු වීම.
2). කොටස් වෙළඳපලේ ලැයිස්තු වියහැකි වීම.
3). කොටස් හිමියන් අවම 1ක් හා උපරිමය අසීමිත වීම.
4). ප්‍රසිද්ධියේ මහජනතාවට කොටස් සඳහා ඇරයුම් කළහැකි වීම.
5). ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළයුතු වීම.
1. 1, 2, 3, 5 2. 1, 3, 4, 5 3. 1, 2, 3, 4 4. 1, 2, 4, 5 5. 2, 3, 4, 5 (...........)

19. පෞද්ගලික සමාගම්, පොදු සමාගම් හා සමුපකාර යන ව්‍යාපාර සංවිධානවල සිටිය හැකි අවම අධ්‍යක්ෂකවරු සංඛ්‍යාව ඇතුළත් පිළිතුර වන්නේ,

| | **පෞද්ගලික** | **පොදු** | **සමුපකාර** |
|---|---|---|---|
| 1. | 1 | 2 | 7 |
| 2. | 1 | 2 | 10 |
| 3. | 2 | 1 | 10 |
| 4. | 2 | 2 | 10 |
| 5. | 1 | 1 | 2 |

(...........)

20. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් හා සමුපකාර සමිති යන ව්‍යාපාර සංවිධාන දෙක ලියාපදිංචි කරනු ලබන ආයතන අයත් වන නිවැරදි පිළිතුර වන්නේ,
   1. සමුපකාර සේවා කොමිෂන් සභාව හා සමාගම් සංවර්ධන දෙපාර්තමේන්තුව
   2. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ.
   3. සමුපකාර කළමණාකරණ ආයතනය හා සමාගම් කළමනාකරණ දෙපාර්තමේන්තුව.
   4. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ හා සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ.
   5. ජාතික සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා සමාගම් දිස්ත්‍රික් කාර්යාලයේ. (...........)

21. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු පවත්වාගන යාම සඳහා ආරම්භ කරන සමාගම් හැඳින්වෙන්නේ,
   1. අක්වෙරළ සමාගම් ලෙසය.
   2. විදේශ සමාගම් ලෙසය.
   3. බහුජාතික සමාගම් ලෙසය.
   4. සීමිත පොදු සමාගම් ලෙසය.
   5. ඇපයෙන් සීමිත සමාගම් ලෙසය. (...........)

22. ව්‍යවසායකත්වය යනු,
   A. ශ්‍රමය හා කළමනාකරණය අතර අතරමැදියෙකු ලෙස කටයුතුකිරීමයි.
   B අවදානම් දරමින් ව්‍යාපාර කටයුතුවල යෙදීමයි.
   C නව ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාමයි.
   D ව්‍යාපාර අවස්ථා ග්‍රහණය කරගැනීමයි.
   E ව්‍යාපාර කටයුතු මගින් ලාභ ලැබීමේ හැකියාවයි.
   1. BCD 2. ABC 3. CDE 4. ADE 5. BDE (...........)

23. ව්‍යවසායකයා යන්නට නිවැරදි අර්ථකථනය වන්නේ,
   1. ව්‍යාපාර කළමණාකරණ කටයුතුවල නිරත වන්නා.
   2. ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක අරමුදල් යොදවන්නා.
   3. නවෝත්පාදන මගින් මිනිස් අවශ්‍යතා සපුරාලීමට වෙනස්කම් කරන්නා.
   4. පියාගෙන් උරුම වූ ව්‍යාපාර අඛණ්ඩව කරන්නා.
   5. ව්‍යාපාරයකට මුදල් යොදවමින් එය කළමණාකරණය කරන්නා. (...........)

24. ව්‍යවසායකයා හා කළමණාකරුවා අතර වෙනස නිවැරදිව දක්වන ප්‍රකාශය තෝරන්න.
   1. ව්‍යවසායකයා ව්‍යාපාරික ගැටලු හඳුනා ගන්නා අතර කළමණාකරු ව්‍යාපාරික අවස්ථා හඳුනාගනී.
   2. ව්‍යවසායකයා ව්‍යාපාර ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කරන අතර කළමණාකරු සමාජ වගකීම්, සමාජ ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමුකරයි.
   3. ව්‍යවසායකයාට තනතුර මත අධිකාරී බලය ලැබෙන අතර කළමනාකරු බලය තමන් විසින්ම නිර්මාණය කරගනී.
   4. ව්‍යවසායකයා ව්‍යාපාරයේ අයිතිකරුවන අතර කළමණාකරු සේවකයෙකු වේ.
   5. ව්‍යවසායකයා ඇරඹූ ව්‍යාපාරය පවත්වාගෙන යන අතර කළමනාකරු ව්‍යාපාරය ආරම්භ කිරීමට මූලිකව කටයුතු කරයි. (...........)

25. සුළු පරිමාණ ව්‍යාපාරයක් මහා පරිමාණ ව්‍යාපාරයකින් වෙන්කොට හඳුනාගත හැකි වන්නේ,
   1. සේවක සංඛ්‍යාව අනුවය.
   2. පිරිවැටුම අනුවය.
   3. ආයෝජිත ප්‍රාග්ධනය අනුවය.
   4. තාක්ෂණය අනුවය.
   5. ඉහත සියල්ල මගින්ය. (...........)

26. රැකියා විරහිත තරුණ තරුණියන්ට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා වන 'ගැමි පුබුදුව වැටසටහන' ක්‍රියාත්මක කරන්නේ,
   1. ලංකා බැංකුව
   2. හැටන් නැෂනල් බැංකුව
   3. මහජන බැංකුව
   4. ජාතික සංවර්ධන බැංකුව
   5. සමෘද්ධි බැංකුව (...........)

27. පහත සඳහන් මුදලේ කාර්යක් ලෙස නොසැලකිය හැකි සාධකය වනුයේ,
  1. වටිනාකමේ මිනුමක් ලෙස කටයුතු කිරීම.
  2. වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම.
  3. විලම්භිත ගෙවුම් මාධ්‍යයක් වීම.
  4. පොදු පිළිගැනීමක් තිබීම.
  5. විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම. (...........)

28. වාණිජ බැංකු පවත්වාගෙන යන ඉල්ලුම් තැන්පතු ශේෂයන් හඳුන්වනු ලබන්නේ,
  1. බැංකු මුදල් ලෙසය.
  2. ආසන්න මුදල් ලෙසය.
  3. ව්‍යවහාර මුදල් ලෙසය
  4. විද්‍යුත් මුල් ලෙසය.
  5. ජංගම මුදල් ලෙසය. (...........)

29. පහත සඳහන් ඒවායින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස සැලකිය හැක්කේ,
  1. මහජන බැංකුව
  2. හැටන් නැෂනල් බැංකුව
  3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
  4. ලංකා බැංකුව
  5. සෙලාන් බැංකුව (...........)

30. පහත සඳහන් ඒවායින් මහා බැංකුවේ කාර්යයක් නොවන්නේ,
  1. ෆිස්කල් ප්‍රතිපත්තිය මෙහෙයවීම.
  2. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.
  3. මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම.
  4. විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම.
  5. විදේශ සංචිත කළමණාකරණය. (...........)

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

31. (අ) වෙළඳපොළ ........................................... මෙන්ම ........................................... ක්‍රම හරහාද නිර්මාණය වේ.

(ආ) පහතින් ඔබට සපයා ඇත්තේ පළතුරු යුෂ බෝතල්කරණය කරනු ලබන නිෂ්පාදන ආයතනයකට අදාළ තොරතුරු කිහිපයකි.

බෝතල්වලට පලතුරු යුෂ පිරවීම, පළතුරු, සේවකයින් පුහුණු කිරීම, ප්‍රචාරණය, නව යන්ත්‍රයකට ආයෝජනය කිරීම.

ඉහත තොරතුරු පදනම් කරගෙන පහත දැක්වෙන වගුවේ හිස්තැන් පුරවන්න.

| **යෙදවුම්** | **ව්‍යාපාර ක්‍රියාවලිය** | **නිමවුම්** |
|---|---|---|
| ................................................... | නිෂ්පාදනය : .....................................<br>අලෙවිකරණය : ..................................<br>මානව සම්පත් : .................................<br>මූල්‍ය : .................................................... | පළතුරු යුෂ පිරවූ බෝතල් |

32. (අ) හොඳ දේ කිරීමත්, නරක දේ නොකිරීමත් ........................................................... ලෙස සැලකේ.

(ආ) ස්වාභාවික පරිසරයක් හෝ සංස්කෘතියක් කෙළෙසන කිසිවක් නොකරන බවට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් ඇතිකරගෙන තිබෙන සම්මුතිය ...................................................... ලෙස හැඳින්වේ.

33. (අ) උද්ධමනය පාලනය, මිල මට්ටම ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම, පොලී අනුපාතය පාලනය කිරීම ............................................................................. තුළින් සිදුකෙරෙන අතර, විදේශ විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම ............................................................................ තුළින් සිදුකෙරේ.

(ආ) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය ................................................................ මගින් පිළිබිඹු වන අතර, මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ ................................................ පවත්වා ගැනීමයි.

34. (අ) වාණිජ බැංකුවල පවතින තැන්පතුවලට අදාළව මහ බැංකුවේපවත්වාගත යුතු තැන්පතු ප්‍රමාණය ........................................................ ලෙස හැඳින්වෙන අතර, මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම ........................................................................ ලෙස හැඳින්වේ.

(ආ) සෞඛ්‍යමය උවදුරු පාලනයකරමින් කරනු ලබන ආහාර නිෂ්පාදන සඳහා පිරිනමන පද්ධති සහතිකය .............................................................. වන අතර, හොඳ නිෂ්පාදන පුරුදු ඇති ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනයේ යෙදී සිටින ආයතනවලට නිකුත් කරන සහතිකය ............................................................. වේ.

35. අවම මිලකට ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම ප්‍රධාන කොටගත් ව්‍යාපාර සංවිධාන වර්ගය (අ)................................................................ වන අතර, එම ව්‍යාපාර සංවිධාන වර්ගය ............................................ හෝ ................................................ යටතේ සංස්ථාගත කරයි.

(ආ) වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදාහැරීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර හැඳින්වෙන්නේ ........................................... ව්‍යාපාර යනුවෙනි.

36. 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව වෘත්තීය හවුල් ව්‍යාපාරයක උපරිම හවුල් කරුවන් ගණන (අ) .......................................... වන අතර, (ආ) කොටස් නිකුත් කිරීම සම්බන්ධයෙන් හා කොටස් මත වූ ඇරයුම් සම්බන්ධයෙන් සමාගමට ලැබුණ හෝ ලැබිය යුතු සියළුම මුදල් වල එකතුව ...................................................... ............................ ලෙස දැක්වේ.

37. (අ) 'අවිනිශ්චිතතාවලට මුහුණ දීම ව්‍යවසායකත්වයයි' යන නිර්වචනය ............................................................ විසින් ඉදිරිපත් කර ඇති අතර,

(ආ) 'නව ව්‍යාපාරයක් දියත්කොට සාර්ථකව පවත්වාගෙන යාමට ඇති හැකියාව ව්‍යවසායකත්වයයි'' යන්න .................................................................................... විසින් ඉදිරිපත් කර ඇත.

38. (අ) ස්වභාවික පරිසරයට ධනාත්මක බලපෑම් ඇතිකරන ව්‍යවසායකයන් ................................................ ................. ලෙස හඳුන්වන අතර,

(ආ) ලෝකය යහපත් ස්ථානයක් බවට පත්කිරීම අරමුණු කරගත් ව්‍යවසායකයින් .................................... ................................ ලෙස හඳුන්වයි.

39. (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනාගැනීම සඳහා සේවක සංඛ්‍යාව 25ට අඩුවීම නිර්ණායකයක් ලෙස ................................................................ ඉදිරිපත්කර ඇති අතර,

(ආ) සේවක සංඛ්‍යාව 50ට අඩුවීම නිර්ණායකයක් ලෙස .......................................................................... ඉදිරිපත් කර ඇත.

40. (අ) ....................................... දරණ මුදල් නීති පනත යටතේ ............................................... දින ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ කරන ලදී.

(ආ) .................................................................................. හා ................................................................................ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වේ.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්න වලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

41. ව්‍යාපාරයක ආසන්න පරිසරු බලවේගවලින් එකක් ලෙස ගණුදෙනුකරුවන් යන්න දැක්විය හැකිය. සෙසු බලවේග හතර කවරේද?

1. ......................................................................	2. ......................................................................
3. ......................................................................	4. ......................................................................

42. වර්තමානයේ තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවී ඇති ප්‍රවණතා හතරක් නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................

43. ව්‍යාපාර ආයතනයක් සමාජය වෙත ඉටුකළ යුතු සමාජයීය වගකීම් 4ක් නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................

44. පාරිභෝගික ජාත්‍යන්තරය විසින් ප්‍රකාශයට පත්කළ පාරිභෝගික අයිතිවාසිකම් 4 සඳහන් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

45. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ප්‍රමිති ක්‍රියාත්මක කරනු ලබන ආකාර 4ක් නම් කරන්න.

1. ........................................................................ 2. ........................................................................

3. ........................................................................ 4. ........................................................................

46. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග හතරක් නම් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

47. වරලත් ගිවිසුම යටතේ වරලත් හිමියා විසින් වරලත් ලාභියාට සපයන පහසුකම් හතරක් සඳහන් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

48. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ මූලික පියවර හතරක් පිළිවෙළින් සඳහන් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

49. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථකවීමට බලපා ඇති හේතු හතරක් සඳහන් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

50. මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යන් 4ක් සඳහන් කරන්න.

1. ........................................................................

2. ........................................................................

3. ........................................................................

4. ........................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

32 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# ව්‍යාපාර අධ්‍යයනය II

කාලය පැය තුනයි

උපදෙස්

♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) (අ) 'අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි සසිකලා ප්‍රතිඵල නිකුත්වන තෙක් අත්කම් නිර්මාණ පාඨමාලාවක්, නර්තන පාඨමාලාවක් හා පරිගණක පාඨමාලාවක් හැදෑරීමටද, සන්දීපනී රූපලාවන්‍ය, චිත්‍රපට නැරඹීම හා විනෝද චාරිකාවක් යාමටද අවදානය යොමුකර ඇත. මෙම සිද්ධිය තුළින් මතුවන අවශ්‍යතා හා වුවමනා වෙන වෙනම වෙන්කරන්න. (ලකුණු 2)

(ආ) ලාභ උපරිම කිරීමට අමතරව ව්‍යාපාරයකට තවත් අරමුණු පැවැතිය හැකිය. එවැනි අරමුණු 4ක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) අයෝමාල් හිරිපිටිය නගරයේ හෝටලයක් පවත්වාගෙන යන අතර, පසුගිය දිනක මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින්කළ පරික්ෂාවකින් පසු ඔහුගේ හෝටලය මුද්‍රා තබන ලදී.

(අ) අයෝමාල්ගේ හෝටලය කෙරෙහි බලපෑම් එල්ලකරන ලද සාර්ව පරිසර බලවේගය නම් කරන්න. (ලකුණු 2)

(ආ) මෙනි ව්‍යාපාරවලට එල්ලවිය හැකි තර්ජනවලට මුහුණ දීම සඳහා අයෝමාල් වැනි හෝටල් හිමියන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) ''ව්‍යාපාර කටයුතු කෙරෙහි ඇල්මැති පාර්ශවයක් ලෙස වර්තමානයේ මාධ්‍යවේදීන් පුළුල් කාර්යභාරයක නිරත වේ.''

(අ) මාධ්‍යවේදීන් ව්‍යාපාර කටයුතු කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) 'සමාජ විගණනය' යන්න හඳුන්වා වර්තමානයේ සමාජ විගණනයක අවශ්‍යතාවය වැඩිවීමට හේතු 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iv) ''ගුණාත්මක නිෂ්පාදිත සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටුවන අතර, එමගින් ව්‍යාපාර පිළිබඳව ඔවුන්ගේ විශ්වාසය ඉහළ යයි''

(අ) ව්‍යාපාර ආචාරධර්ම යන්න හඳුන්වා, ව්‍යාපාර ශ්‍රිතය අනුව ව්‍යාපාර ආචාරධර්ම වර්ග කර දක්වන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී අවධානය යොමුකළ යුතුකරුණු මොනවාද?(ලකුණු 2)

(v) ''ව්‍යාපාරයක සංවිධාන සංස්කෘතිය සමස්ථ ව්‍යාපාරයටම වටිනාකමක් ලබා දේ''

(අ) සංවිධාන සංස්කෘතිය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)

(ආ) එය ව්‍යාපාරයකට වටිනාකමක් ලබාදෙන්නේ කෙසේද? (ලකුණු 2)

02. (i) සම්ප්‍රදායිකව නිෂ්පාදන සාධක හෙවත් සම්පත් ලෙස සැලකිල්ලට ගනු ලැබූයේ භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසාය පමණක්වුවද, වර්තමානයේ ඊට අමතරව දැනුම, තොරතුරු හා කාලය ද සම්පත් ලෙස පිළිගනී. මෙසේ දැනුම, තොරතුරු හා කාලය සම්පත් ලෙස පිළිගන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ක්ෂණික ආහාර ව්‍යාපාරය (Fast Food Business) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන්හි ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.

(අ) ක්ෂණික ආහාර ව්‍යාපාරයේ සීඝ්‍ර වර්ධනයට බලපාන සාර්ව පාරිසරික සාධක මොනවාද?(ලකුණු 2)

(ආ) ක්ෂණික ආහාර ව්‍යාපාරය තුළ නව ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනිම කෙරෙහි හිතකර ලෙස බලපාන අභ්‍යන්තර පාරිසරික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) වෙළඳපොළ ස්ථානය හා වෙළඳපොළ අවකාශය අතර ඇති සමානකම් හා අසමානකම් දෙක බැගින් නම් කරන්න. (ලකුණු 2)

(ආ) වාණිජ්‍ය හා ව්‍යාපාර අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) සමාජය තුළ ව්‍යාපාර විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටුකරනු ලැබේ.

(අ) කාර්මික විප්ලවය හේතුකොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුළ කෘෂිකර්මාන්තය මූලික වුවද වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතරව විවිධ වූ අංශ වෙත නැඹුරුවීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) වර්ථමානයේ සමහර ව්‍යාපාර කොටස්කරු සංකල්පයෙන් (Shareholders concept) ඉවත්වී ඇල්මැති පාර්ශව සංකල්පයට (Stakeholders concept)අවතීර්ණ වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

03. (i) (අ) සේවකයින්ගේ දෘෂ්ඨියෙන් බලන විට සේව්‍ය පාර්ශවය විසින් සේවකයින්ට සිය වගකීම් ඉටු නොකලේ යැයි සැලකිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) බස් රථයක ගමන් කරන මගියෙකු හා කොන්දොස්තර මහතෙකු විසින් පිළිපැදිය යුතුයැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම දෙක බැගින් ලියන්න. (ලකුණු 2)

(ii) ඔබ දන්නා ව්‍යාපාර ආයතනයක් උදාහරණයට ගෙන එම ආයතනය සමාජ වගකීම් සංකල්පයට කෙසේ දායකවන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න.(ලකුණු 2)

(ආ) ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසරබව තහවුරු කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 4ක් ලියන්න. (ලකුණු 2)

(iv) (අ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇතිකරන බලවේග 4ක් නම් කරන්න. (ලකුණු 2)

(v) (අ) රජයක් ඉටුකර ගැනීමට කටයුතු කරන ආර්ථික අරමුණු 4ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) රජයක් විසින් ව්‍යාපාරවලින් විවිධ බදු අය කරමින් ව්‍යාපාර කෙරෙහි බලපෑම් සිදු කරමින් කටයුතු කරයි. රජය බදු අය කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

04. (i) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ මුදල් පාලනය සඳහා යොදාගනු ලබන ප්‍රධාන උපකරණය පොලී අනුපාතයයි. මෙහි ප්‍රධාන කොටස් නම් කර, පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණාත්මක ණය සීමා පැනවීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 2)

(ආ) රජයක ප්‍රාග්ධනවියදම් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ඊට නිදසුන් 2ක් දක්වන්න. (ලකුණු 2)

(iii) (අ) පාරිභෝගික ආරක්ෂණය ව්‍යාපාරිකයාට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

(අ) දැනුවත්භාවයකින් යුත් පාරිභෝගිකයා වෙළෙඳපොල තුළ හැසිරෙන ආකාරය පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iv) (අ) පාරිභෝගිකයාට වෙළඳපොළ තුළ ව්‍යාපාරිකයින්ගෙන් සිදුවිය හැකි වෙළෙඳ විෂමාචාර සඳහා නිදසුන් 4ක් දක්වන්න. (ලකුණු 2)

(ආ) SLS සහතිකය අනිවාර්යයෙන්ම ලබාගත යුතු යැයි පාරිභෝගික ආරක්ෂණ අධිකාරී පනත මගින් නියම කර ඇති භාණ්ඩ වර්ග 4ක් දක්වන්න. (ලකුණු 2)

(v) (අ) පාරිභෝගිකයෙකුට ආරක්ෂාව සලසා ගත හැකි ප්‍රධාන ක්‍රම 2ක් පිළිබඳ පැහැදිලි කරන්න.(ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන උපකරණ 4ක් නම් කරන්න. (ලකුණු 2)

## II කොටස

05. (i) (අ) මහ බැංකු පොලී අනුපාතිකය අඩු කිරීමක්, වාණිජ බැංකුවලට, ආයෝජකයින්ට, ව්‍යාපාරවලට බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) පාරිභෝගික ආරක්ෂණ අධිකාරී පනත මගින් ඕනෑම භාණ්ඩයක දැක්විය යුතු යැයි අවධාරණය කර ඇති කරුණු මොනවාද? (ලකුණු 2)

(ii) සහන් හා පහන් මිතුරන් වන අතර සහන් නිතරම තනි තීරණ ගැනීමට කැමති තම ක්‍රියාකාරකම් වලදී ඒවායේ අවදානම, වාසි අවාසි ද තමාම විඳදරා ගැනීමට සූදානම් පුද්ගලයෙකි. පහන් තමකටයුතු වලදී සාමූහික තීරණ ගැනීම හා යම් කටයුත්තකදී අවදානම් බෙදා ගැනීමට කැමති අයෙකි.

(අ) සහන් හා පහන්ගේව්‍යාපාර සංවිධාන වර්ග 2 වෙනවෙනම දක්වන්න. (ලකුණු 1)

(ආ) මිතුරන් දෙදෙනා ඔබ නම්කළ ව්‍යාපාර ආරම්භ කළේ නම් එම ව්‍යාපාර දෙකේ වාසි අවාසි 2 බැගින් ලියන්න. (ලකුණු 3)

(iii) දිළුම් වාණිජ අංශයෙන් ඉගෙනුම ලැබූ විවිධ හැකියාවන්ගෙන් යුතු දක්ෂ සිසුවෙකි. ඔහුගේ පියාගේ රැකියාව වූයේ තම සොහොයුරා සමඟ බේකරි ව්‍යාපාරයක් පවත්වාගන යාමයි. දෙදෙනා මූලික ධනය යොදමින් කටයුතු කරගෙන යන අතර ලාභ අලාභ ද බෙදාගනී. ඔවුන්ගේ ව්‍යාපාරයේ ප්‍රදේශයේ ප්‍රචලිත ව්‍යාපාරයක්වුවද තවදුරටත් පුළුල්කර ගැනීමට තම පුතු දිළුම්ගෙන් විමසති. ඔහු විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි, රජය හා මුල්‍ය ආයතනද පිළිගැනීමට ලක්වන්නාවූ වගකීම සීමිත වන්නාවූ ව්‍යාපාරයක් ඇරඹීමට උපදෙස් දෙන ලදී.

දිළුම් ආරම්භකර පවත්වාගෙන යාමට තම පියාට දුන් ව්‍යාපාරයනම් කරන්න. එය පෙර පැවති ව්‍යාපාරයට වඩා වාසි අවාසි දායක වූ ආකාරය පිළිබඳ කරුණු 4ක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) (අ) 'ලැයිස්තුගත සමාගම් අනිවාර්යයෙන්ම පොදු සමාගම් වේ. සීමිත පොදු සමාගම් සියල්ල ලැයිස්තුගත සමාගම් වේ.' මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද යන්නට හේතු දක්වන්න. (ලකුණු 2)

(ආ) සීමිත පොදු සමාගම් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයට දායක වන්නේ කෙසේද යන්න හේතු දක්වන්න. (ලකුණු 2)

(v) (අ) පොදු හිමිකාරීත්වය යටතේ පවත්වාගන යනු ලබන ලාභ ලබන හා පෞද්ගලික හිමිකාරිත්වය යටතේ සුභසාධනය මුල්කරගත් ව්‍යාපාර සංවිධාන වර්ග නම් කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පොදු හිමිකාරිත්වය යටතේද පවත්වාගන යනු ලබයි. මෙලෙස පොදු හිමිකාරිත්වය යටතේ ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතු දක්වන්න. (ලකුණු 2)

06. (i) (අ) ව්‍යාපාර සංයෝජන යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යාපාර සංයෝජනය වී ඇති ආකාර නම්කර ඉන් එකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ii) (අ) ව්‍යාපාර සංයෝජන ඇතිකර ගැනීමේ වාසි දක්වන්න. (ලකුණු 2)

(ආ) පහත දැක්වෙන ව්‍යාපාර සංවිධාන 2කට අයත් ලක්ෂණ පිළිබඳ වගුව තුළ සම්පූර්ණ කර දක්වන්න.

| **ව්‍යාපාර සංවිධානය** | **ප්‍රාග්ධන සම්පාදනය** | **වගකීම** | **නෛතික පුද්ගලබව** | **සාමාජික සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| 1. හවුල් ව්‍යාපාර<br>2. සමුපකාර | | | | |

(ලකුණු 2)

(iii) (අ) සංස්ථාපිත නොවූ ව්‍යාපාර සංවිධාන වර්ග 3ක් නම් කරන්න. (ලකුණු 2)

(ආ) සංස්ථාපිත නොවූ ව්‍යාපාර සංවිධාන වර්ග වලට වඩා සංස්ථාපිත ව්‍යාපාර සංවිධාන වර්ග ඇරඹීම තුළ වාසි සහගත තත්වයන් සමූහයක් වේ. මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? එසේනම්ඒ සඳහා කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 2)

(iv) (අ) පහත සඳහන් එක් එක් නීතිමය මූලාශ්‍රයන් අයත්වන ව්‍යාපාර සංවිධානවර්ග ඉදිරියෙන් ලියන්න. එයින් 2007 පනත යටතට ගැනෙන ව්‍යාපාර සංවිධාන නම් කරන්න.

1. 1918අංක 06 දරණ පනත 2. 1992 අංක 11 දරණ සමුපකාර (සංශෝධන) පනත

3. 1890 ව්‍යාපාර ආඥා පනත 4. 2007 අංක 7 දරණ පනත. (ලකුණු 2)

(ආ) කෘෂි උපකරණ හා ද්‍රව්‍ය අලෙවි ව්‍යාපාරයක් පවත්වාගන යනු ලබන ගම්ලත් නැමැත්තා පහත ව්‍යාපාර සංවිධාන වර්ග යටතේ තම ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නම් ඔහු එම ව්‍යාපාරයට නම් යොදන ආකාරය පිළිවෙළින් ඉදිරියෙන් ලියන්න. (ලකුණු 2)

| | ව්‍යාපාර සංවිධාන වර්ගය | යෝජිතය |
|---|---|---|
| 1 | කේවල ස්වාමි ව්‍යාපාර | ................................................ |
| 2 | හවුල් ව්‍යාපාර | ................................................ |
| 3 | සී/ස පෞද්ගලික සමාගම | ................................................ |
| 4 | සී/ස ලැයිස්තු ගත නොකල සමාගම් | ................................................ |
| 5 | සී/ස ලැයිස්තුගත සමාගම | ................................................ |

(v) ව්‍යවසායකයා යනු කවරෙක්දැයි හැඳින්වීමට පීටර් එෆ් ඩකර් විසින් ඉදිරිපත් කර ඇති නිර්වචනය සඳහන් කරන්න. (ලකුණු 4)

07. (i) (අ) ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හතරක් නම්කර පැහැදිලි කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකයින් යනු විවිධ කුසලතා සහිත පුද්ගලයන් වේ. ඔවුන් සතු කුසලතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) ව්‍යවසායකයාහා ව්‍යාපාරිකයා අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) (අ) ව්‍යවසායකත්වය තුළින් සමාජ, ආර්ථික මෙන්ම පුද්ගල ප්‍රතිලාභද අත්කරදෙයි. ව්‍යවසායකත්වය තුළින් අත්කරගත හැකි පුද්ගල ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කරගත හැකි ආකාර මොනවාද? (ලකුණු 2)

(iv) (අ) පහත සඳහන් ආයතන කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති නිර්ණායක මොනවාද?

1. කාර්මික සංවර්ධන මණ්ඩලය 2. ශ්‍රී ලංකා මහ බැංකුව.

3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය (ලකුණු 2)

(ආ) රටක ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඉවහල්වන පසුබිම් සාධක පැහැදිලි කරන්න. (ලකුණු 2)

(v) (අ) මහා පරිමාණ ව්‍යාපාර හා සසඳන කළ කුඩා ව්‍යාපාරවල දැකිය හැකි වාසි හා අවාසි දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) සුළු හා මධ්‍යපරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී සලකා බැලිය යුතු සාධක මොනවාද?(ලකුණු 2)

08. (i) සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර වලින් වෙන්කර හඳුනාගැනීම සඳහා යොදාගන්නා ප්‍රමාණාත්මක සාධක හතරක් සහ ගුණාත්මක සාධක හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

(ii) (අ) මුදල් යනු මොනවාදැයි හඳුන්වන්න. (ලකුනු 2)

(ආ) විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)

(iii) (අ) හොඳ මුදලක තිබිය හැකි ලක්ෂණ 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ආසන්න මුදල් හඳුන්වන්න. (ලකුණු 2)

(iv) (අ) විද්‍යුත් මුදල් මගින් ගෙවීම් පහසුකිරීම සඳහා සපයා ඇති පහසුකම් හෙවත් සේවා 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය අනුව විශේෂිත මූල්‍ය ආයතන ලෙස වර්ග කරන ආයතන වර්ග 4ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(v) (අ) ඒකක භාරයක ප්‍රධාන පාර්ශව 3 සඳහන් කරන්න. (ලකුණු 2)

(ආ) ලංකා සෙටල් පද්ධතිය (Lanka Settle System) සකස්වන ප්‍රධාන කොටස් දක්වා පැහැදිලි කරන්න. (ලකුණු 2)

# දෙවන වාර පරීක්ෂණය - 2020
# 12 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - පිළිතුරු
## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - 4 | (11) | - 4 | (21) | - 1 |
| (02) | - 2 | (12) | - 4 | (22) | - 1 |
| (03) | - 3 | (13) | - 3 | (23) | - 3 |
| (04) | - 2 | (14) | - 3 | (24) | - 4 |
| (05) | - 4 | (15) | - 2 | (25) | - 5 |
| (06) | - 1 | (16) | - 3 | (26) | - 2 |
| (07) | - 4 | (17) | - 4 | (27) | - 4 |
| (08) | - 5 | (18) | - 5 | (28) | - 2 |
| (09) | - 4 | (19) | - 1 | (29) | - 3 |
| (10) | - 2 | (20) | - 2 | (30) | - 1 |

31. (අ) භෞතික/ස්ථානය, විද්‍යුත් අවකාශය
(ආ) **යෙදවුම්** **ව්‍යාපාර ක්‍රියාවලිය**
පළතුරු බෝතල්වලට පළතුරු යුෂ පිරවීම
ප්‍රචාරණය, සේවකයින් පුහුණු කිරීම, නව යන්ත්‍රයකට ආයෝජනය
(කරුණු 5කට ලකුණු $^1/_2$, කරුණු 2-3 කට ලකුණු 1/2)

32. (අ) ආචාර ධර්ම (ල. 1) (ආ) කියෝටෝ (Kyoto protocol) (ලකුණු 1)

33. (අ) අභ්‍යන්තර මිල ස්ථායිතාව, බාහිර මිල ස්ථායිතාව
(ආ) රාජ්‍ය අයවැය ලේඛනය, දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව

34. (අ) ව්‍යවස්ථාපිත සංචිතය, විවෘත වෙළඳපොළ කටයුතු/විවට වෙළඳපොළ කටයුතු
(ආ) HACCP සහතිකකරණය (Hazard Analysis Criticle Control Points)
GMP සහතිකය (Good Manufacturing Practices)

35. (අ) රාජ්‍ය සංස්ථා, විශේෂ, පොදු (ආ) නිෂ්පාදන වරලත් ව්‍යාපාර

36. (අ) අසීමිත (ආ) ප්‍රකාශිත ප්‍රාග්ධනය

37. (අ) රිචඩ් නැන්ට්නට් (ආ) අන්තර්ජාතික කම්කරු සංවිධානය

38. (අ) හරිත ව්‍යවසායකයින් (ආ) සමාජයීය ව්‍යවසායකයින්

39. (අ) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (ආ) ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

40. (අ) 1949 අංක 58, 1950 අගෝ. 28
(ආ) ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම, මුල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වාගෙන යාම.

41. 1. සැපයුම්කරුවන් 2. ආදේශන භාණ්ඩ සපයන්නන්
3. විභව ව්‍යාපාරිකයන් 4. තරගකරුවන් (කරුණු 4ට ලකුණු 2)

42. 1. ගෝලීයකරණය ව්‍යාප්තවීම. 2. විද්‍යුත් ව්‍යාපාර බිහිවීම. 3. විද්‍යුත් මුදල් භාවිතයට පැමිණීම.
4. පරිසරය පිළිබඳ සැළකිලිමත්වීම. 4. ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳව සැලකිලිමත්වීම.(කරුණු 4ට ලකුණු 2)

43. 1. සේවා නියුක්තියට දායක වීම. 2. බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම. 3. අපද්‍රව්‍ය කළමනාකරණය
4. ප්‍රජා සත්කාර සේවා. 5. හරිත නිෂ්පාදිත බිහිවීම. 6. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම.
(කරුණු 4ට ලකුණු 2)

44. 1. මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය. 2. වන්දි ලබාගැනීමට ඇති අයිතිය.
3. පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය. 4. සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.
(කරුණු 4ට ලකුණු 2)

45. 1. ස්වේච්ඡාවෙන්. 2. SLS සහතික ලාංඡන ක්‍රමය මගින්. 3. පූර්ව අපනයන පරික්ෂාව මගින්.
4. ආනයන පරික්ෂාව මගින්. 5. අපනයනය පිළිබඳ පිළියෙළ කළ මුහුදු ආහාර පරික්ෂාව මගින්.
(කරුණු 4ට ලකුණු 2)

46. රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සමාගම්, පළාත් සභා පළාත් පාලන ආයතන
(කරුණු 4ට ලකුණු 2)

47. 1. සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම. 2. කළමනාකරණ පුහුණුව ලබාදීම.
3. ආලෙව්කරණ සහය දීම. 4. මූල්‍ය පහසුකම් දීම. (කරුණු 4ට ලකුණු 2)

48. 1. නව්‍යතා සොයා ගැනීම. 2. සංකල්ප ගොඩනැගීම හා ව්‍යාපාර සැලැස්ම සැකසීම.
3. අවශ්‍ය සම්පත් සම්පාදනය 4. යථාර්ථයක් බවට පත්කර ගැනීම. (කරුණු 4ට ලකුණු 2)

49. 1. පුළුල් වෙළෙඳපොලක් පැවතීම. 2. මුල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්.
3. ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම. 4. දක්ෂ කළමනාකරණයක් පැවතීම.
5. ව්‍යාපාරිකයාගේ උනන්දුව හා කැපවීම. 6. විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබාදීම (කරුණු 4ට ලකුණු 2)

50. 1. රජය ණය කළමනාකරණය 2. විදේශ විනිමය පාලනය.
3. කුඩා පරිමාණ මුල්‍යකරණ වැඩසටහන් සඳහා ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳව මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.
4. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය. (කරුණු 4ට ලකුණු 2)

## II - කොටස

01. (i) (අ) අවශ්‍යතා — වුවමනා
අධ්‍යාපනය — අත්කම් නිර්මාණ පාඨමාලාව, නර්තන පාඨමාලාව, පරිගණක පාඨමාලාව.
වින්දනය — රූපලාවන්‍ය , චිත්‍රපට නැරඹීම, විනෝද චාරිකාව

(ආ) 1. සමාජ සුභසාධනය 2. පුළුල් වෙළඳපොලක් ලබාගැනීම.
3. කීර්තිනාමය වර්ධනය 4. කොටසක අගය උපරිම කිරීම.
5. විකුණුම් වැඩිකර ගැනීම. 6. පිරිවැය අඩුකරගැනීම.

(ii) (අ) නෛතික පරිසරය
(ආ) 1. පිරිසිදු ආහාරපාන පාරිභෝගිකයාට ලබාදීම.
2. සේවකයන්ට සෞඛ්‍යාරක්ෂිතව සේවය ලබාදීමට උපදෙස් දීම.
3. හෝටලය තුළ සහ අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම.

(iii) (අ) 1. සේවක අයිතීන් ආරක්ෂා වනවාදැයි විමසා බැලීමට.
2. අපද්‍රව්‍ය නිසිලෙස කළමණාකරණය කරනවාදැයි දැන ගැනීමට.
3. පරිසර දූෂණය නොවන ආකාරයට කටයුතු ඉටුකරනවාදැයි විමසා බැලීමට.
4. පාරිභෝගික අයිතීන් ආරක්ෂාවනවාදැයි විමසා බැලීමට.

(ආ) ව්‍යාපාර ආයතනයක් කොතෙක් දුරට ව්‍යාපාර ආචාරධර්ම ආරක්ෂාවන අයුරින කටයුතු කරනවාද, ව්‍යාපාරයේ සමාජ වගකීම් කොතෙක් දුරට ඉටු කරනවාද යන්න පිළිබඳව තුන්වන පාර්ශ්වයක් විසින් සිදුකරනු ලබන විමර්ශනයයි. (ලකුණු 1)
හේතු: 1. ව්‍යාපාරවල වෙළඳ විෂමාචාර වැඩිවීම.
2. කම්කරු අණපනත් වලින් හිමි සේවක අයිතීන් උල්ලංඝනයවීම.
3. බාලවයස්කරුවන් සේවයේ යෙදවීම් ඉහළයාම.
4. අයුතු බලපෑම් වැඩිවීම.
5. මුල්‍ය වංචා හා ගැටුම් වැඩිවීම.
6. අල්ලස් ගැනීම් වැඩිවීම. (ලකුණු 3)

(iv) (අ) ව්‍යාපාර තමන් සමඟ කටයුතු කරන සියළු පාර්ශවවලට යහපතක් සිදුවන ආකාරයට හොඳ නරක පිළිබඳව අවබෝධයෙන් කටයුතු කිරීමයි. (ලකුණු 1)
ආචාර ධර්ම වර්ග කිරීම :
1. නිෂ්පාදනයට අදාළ ආචාරධර්ම. 2. අලෙවිකරණයට අදාළ ආචාර ධර්ම.
3. මුල්‍ය හා ගිණුම්කරණයට අදාළ ආචාරධර්ම.
4. මානව සම්පත් කළමණාකරණයට අදාළ අචාරධර්ම.
5. බුද්ධිමය දේපළ වලට අදාළ ආචාරධර්ම. (කරුණු 2ට ලකුණු 1)

(ආ) 1. ව්‍යාපාරය 2. සේවකයා 3. සමාජ සංස්කෘතිය 4. ප්‍රායෝගික බව
5. ගනුදෙණුකරු 6. තරගකරුවන් 7. සංවිධාන සංස්කෘතිය 8. දැරීමට සිදුවන පිරිවැය(කරුණු 4ට ලකුණු 2)

(v) (අ) ව්‍යාපාරයේ සිටින සියලු දෙනා අතර බෙදාහදා ගන්නා හා ඊළඟ පරම්පරාව වෙත පවරාදෙනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු හැසිරීම් රටා සංවිධාන සංස්කෘතිය නම් වේ. (ලකුණු 2)

(ආ) 1. ව්‍යාපාර ආයතනයක සංවිධාන සංස්කෘතිය තුළ විවිධ විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු හැසිරීම් රටා අඩංගු වේ. ව්‍යාපාරය එම සංස්කෘතිය අනාගත පරම්පරාවටද පවරාදිය යුතුය.
2. ධනාත්මක ඇගයීම් හා චර්යා පද්ධතියක් ව්‍යාපාරය තුළපැවතීම, ආවේණික දියුණු ආචාරධර්ම හා පුරුදු ව්‍යාපාරය තුළ පැවතීම මගින් ව්‍යාපාරයට වටිනාකමක් ලබාදේ. (කරුනු 2ට ලකුණු 2)

02. (i) දැනුම : ව්‍යාපාර ආයතනයේ සේවකයන්ගේ දක්ෂතා හා කුසලතා ආයතනයට සම්පතකි. දැනුම අධ්‍යාපනයෙන් හා අත්දැකීම්තුළින් ලබාගත් අවබෝධයකි.

කාලය : අනෙකුත් සම්පත් මෙහෙයවීමේදී කාලය වැදගත්ය. කාලය සීමිත හෙයින්යම් කාර්යයක් කිරීමේදී ඒ සඳහා නිශ්චිත කාලයක් නියම කිරීම සිදුකළ යුතුය.

තොරතුරු : ආයතනයක් විසින් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය තීරණ ගැනීමේදී තොරතුරු ඉතා වැදගත් වේ. තොරතුරු මත පදනම් වූ වත්මන් ආර්ථිකය තුළ තොරතුරු යනු ව්‍යාපාරයකට අත්‍යවශ්‍ය සම්පතකි. (නම්කර පැහැදිලි කිරීමට ලකුණු 4)

(ii) (අ) 1. සමාජ හා සංස්කෘතික සාධක. 2. දේශපාලන හා නීතිමය සාධක
3. තාක්ෂණික සාධක. 4. ආර්ථික සාධක 5. ප්‍රජා සාධක 6. ගෝලීය සාධක(ඕනෑම 4කට ලකුණු 2)

(ආ) 1. සේවකයින්ගේ හිතවත්කම. 2. හිතකර භෞතික පරිසරය.
3.සේවක කාර්යක්ෂමතාවය 4. ක්ෂණික සේවා. 5. නිෂ්පාදිත විවිධත්වය
6. ආකර්ෂණීය ආයතන බිම් සැලැස්ම (කරුණු 4ට ලකුණු 2)

(iii) (අ) සමානකම් : 1. හුවමාරුවක් සිදුවීම. 2. පාර්ශව දෙකක් හෝ වැඩි ගණනක් පැවතීම.
3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුවීම. (කරුණු 2 X 1/2 = ලකුණු 1)

අසමානකම් :

| **වෙළඳ පොළ ස්ථානය** | **වෙළඳපොළ අවකාශය** |
|---|---|
| 1. භෞතික ස්ථානයක් ඇත. | භෞතික ස්ථානයක් නැත. |
| 2. විද්‍යුත් මාධ්‍ය මගින් සිදු නොවීම. | විද්‍යුත් මාධ්‍ය මගින් සිදුවීම. |
| 3. වෙළඳපොළ ස්ථානයසීමා සහිතයි. | වෙළඳපොළ අවකාශය පුළුල්ය.(කරුණු 2X 1/2 = ලකුණු 1) |

(ආ) වෙළඳම හා ව්‍යාපාර සේවාවල එකතුව වාණිජ්‍ය වේ. වාණිජ්‍ය හා කර්මාන්තවල එකතුව ව්‍යාපාර වේ. වෙළඳම ව්‍යාපාරවල කොටසකි. (ලකුණු 2)

(iv) (අ) 1. මහා පරිමාණ නිෂ්පාදනය 2. නව තාක්ෂණික ශිල්පක්‍රම බිහිවීම.
3. සේවා නියුක්ති අවකාශය වැඩිවීම. 4. කම්හල් ක්‍රමය බිහිවීම.
5. නාගරීකරණය 6. වෙළඳපොළ දේශීය හා විදේශීයව ව්‍යාප්තවීම.(කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. තාක්ෂණයේ සංවර්ධනය 2. ගෝලීයකරණය 3. යටිතල පහසුකම්වල ගැටළු
4. කෘෂිකාර්මික නිෂ්පාදිතවලට හොඳ මිලක් නොතිබීම. 5. ස්වභාවික පරිසරික බාධා
6. උගත් තරුණ පරම්පරාවේ ආකල්ප 7. ජීවන රටාව වෙනස්වීම. (කරුණු 4ට ලකුණු 2)

(v) කොටස්කරු සංකල්පය යනු කොටස්කරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි ධනය උපරිම කිරීම කෙරෙහි පමණක් අවධානය යොමුකිරීමයි. ඇල්මැති පාර්ශ්ව සංකල්පය යනු ව්‍යාපාරයට ඇල්මක් දක්වන සියළු පාර්ශ්වයන්ගේ අපේක්ෂාවන් ඉටුකිරීම කෙරෙහි සැලකිල්ල යොමුකිරීමයි.

වර්තමානයේ කොටස්කරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි ධනය උපරිමකිරීම පමණක් නොව සියළුම ඇල්මැති පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටුකර දීම තුළින් ව්‍යාපාරය වඩා සාර්ථක කර ගත හැකිවේ.(කොටස්කරු සංකල්පය හඳුනාගැනීමට ලකුණු 1, ඇල්මැති පාර්ශ්ව සංකල්පය හඳුනාගැනීමට ලකුණු 1, හේතුව පැහැදිලි කිරීමට ල. 2)

03. (i) (අ) 1. වැඩ බෙදීම හා කාර්යයන් පැවරීමේදී. 2. උසස්වීම් ලබාගැනීමේදී.
3. වැටුප්තල සකස් කිරීමේදී. 4. පුහුණුව හා සංවර්ධනයට තෝරාගැනීමේදී.
5. කාර්යඵල ඇගයීමේදී. 6. සේවකයින් ස්ථිර කිරීමේදී.
7. සේවක සුභසාධන කටයුතුවලදී. 8. සේවක බඳවා ගැනීමේදී.(කරුණු 2ට ලකුණු 2)

(ආ) මගියා : 1.නියමිත මුදල ගෙවා ප්‍රවේශ පත්‍රය ලබාගැනීම.
2. බසය තුළ විනීතව හැසිරීම.
3. ආබාධිත, ගර්භනී මාතාවන්ට, පූජකවරුන්ට ආසන පිරිනැමීම.
4. බස් රථයට හානි නොකිරීම. (කරුණු 2ට ලකුණු 1)

කොන්දොස්තර මහතා : 1. විනීතව කතා කිරීම. 2. නියමිත පරිදි ඉතිරිමුදල් ගෙවීම.
3. බස්රථය පිරිසිදුව පවත්වාගැනීම. 4. අවශ්‍ය අයට උදව් කිරීම.(කරුනු 2ට ලකුණු 1)

(ii) ආයතනයක් නම් කිරීමට (ලකුණු 1)
එම ආයතනය සමාජ වගකීමට දායකවන ආකාරය පැහැදිලි කිරීමට. (ලකුණු 3)
උදා : 1. පාසල් සඳහා අනුග්‍රාහකත්වය 2. ආරෝග්‍යශාලා වැඩිදියුණු කිරීම.
3. මංමාවත් සංවර්ධනය කිරීම. 4. ක්‍රීඩා උපකරණ සැපයීම.
5. පරිසර සංරක්ෂණ කටයුතු ඉටු කිරීම.

(iii) (අ) 1. රැකියා නිර්මාණය. 2. කුසලතා බලගැන්වීම.
3. සම්පත් කාර්යක්ෂමව භාවිතය.4. අවදානම් කලමනාකරණය.
5. නව්‍යතා හඳුන්වාදීම. 6. නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම.

7. තාක්ෂණය දියුණු කිරීම. 8. පිළිගත් වෙනත් පිළිතුරු. (කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම. 2. මානව අයිතිවාසිකම් සුරැකීමට දායකවීම.
3. සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම. 4. සමාජ සංරක්ෂණ කටයුතුවලට දායකවීම.
5. සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම. 6. නීතියහා සාමය සුරැකීම.
7. පිළිගත් වෙනත්. (කරුණු 4ට ලකුණු 2)

(iv) (අ) 1. මුල්‍ය වංචා අවම කර ගැනීමට හැකියාවක් ලැබීම.
2. සේවකයින්ට සමානව සැලකීමට අවස්ථාව ලැබේ.
3. සේවක තෘප්තිය හා විශ්වාසය වැඩි වේ. 4. ආයතනයේ කීර්තිනාමය වැඩි වේ.
5. සේවක ආකර්ෂණය පහසු වේ. 6. පාරිභෝගික තෘප්තිය වැඩි වේ.
7. ශ්‍රම පිරිවැටුම අඩුවේ. 8. සේවක ප්‍රවාසිතාවය අඩුවේ.(කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. ව්‍යාපාර තරගය. 2. ගෝලීයකරණය
3. විද්‍යුත් ව්‍යාපාර 4. පරිසර දූෂණය (කරුණු 4ට ලකුණු 2)

(v) (අ) 1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය 2. පූර්ණ සේවා නියුක්තිය.
3. සාධාරණ ආදායම් ව්‍යාප්තිය. 4. ආර්ථික ස්ථායිතාව.
5. යහපත් අන්තර්ජාතික වෙළෙඳම. (කරුණු 4ට ලකුණු 2)

(ආ) 1. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. 2. සුරාබදු දෙපාර්තමේන්තුව
3. රේගු දෙපාර්තමේන්තුව. 4. මෝටර් රථවාහන දෙපාර්තමේන්තුව.

04. (i) (අ) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය, නිත්‍ය ණයපහසුකම් අනුපාතය, බැංකු පොලී අනුපාතිකය.(ලකුණු 1)
**නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය :** වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහ බැංකුවේ ඇති රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතිකයයි. (ලකුණු 1)
**නිත්‍ය ණය පහසුකම් අනුපාතය :** වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් අරමුදල් ලබාගැනීමේදී අයකරනු ලබන පොලී අනුපාතයයි. (ලකුණු 1)
**බැංකු පොලී අනුපාතිකය :** ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණ දෙන වාණිජ බැංකුවලටය ශ්‍රී ලංකා මහ බැංකුව අවසාන ණය දෙන්නා ලෙස සපයනු ලබන ණය සඳහා අයකරනු ලබන පොලී අනුපාතයයි.(ලකුණු 1)

(ii) (අ) රටේ සමස්ථ මුදල් සැපයුමට බලපෑමක් ඇති කරන බැංකු ණය ප්‍රමාණය අඩු හා වැඩි කරමින් සමස්ථ ණය ප්‍රමාණය පාලනය කිරීමයි. (ලකුණු 2)
(ආ) අදාළ නිදසුන් 2ක් දක්වමින් පැහැදිලි කිරීමට (ලකුණු 2)

(iii) (අ) * ගුණාත්මක තත්ත්වයෙන් යුක්ත භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනාගත හැකිවීම.
* ව්‍යාපාරිකයාගේ පිරිවැටුම වැඩිවීම තුළින් ලාභය ඉහළයාම.
* ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කිරීම නිසා අපතය අඩුවීම.
* අයහපත් තරග විරෝධී ක්‍රියා නොමැතිවීමෙන් යහපත් ව්‍යාපාර පරිසරයක් ඇතිවීම.(කරුණු 4ට ලකුණු 2)
(ආ) දැනුවත් පාරිභෝගිකයා ගෙවන මුදලටසරිලන වටිනාකමකින් යුත්, ප්‍රමිතියෙන් ඉහළ භාණ්ඩ තෝරා ගැනීමට පෙළඹේ. වෙළඳ විෂමාචාර හා පාරිභෝගික අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කරයි. පරිසරය ආරක්ෂා කරයි. සමාජය පිළිබඳ සැලකිලිමත් වෙයි. සහයෝගයෙන් කටයුතු කරයි. (පැහැදිලි කිරීම සහිත පිළිතුරට ලකුණු 2)

(iv) (අ) වෙළෙඳ විෂමාචාර 4ක් දක්වා ඇති පිළිතුරට. (ලකුණු 2)
(ආ) * ජෑම් වර්ග * පළතුරු හා කෘත්‍රිම බීම වර්ග * ගෘහ විදුලි පද්ධති උපකරණ
* කෝඩියල් වර්ග * සිමෙන්ති බ්ලොක් ගල් * ආරක්ෂිත හෙල්මට්
* උකුකිරි * විදුලි බල්බ * ඇස්බැස්ටස් තහඩු * ටින් මාළු (කරුණු 4කට ලකුණු 2)

(v) (අ) * ස්වයං ආරක්ෂාව - තමා විසින්ම ආරක්ෂාව සලසා ගැනීමයි.
* රජයේ අණපණත් හා අයතන මගින් සිදුකරන පාලනය.
* සංවිධානාත්මක ආරක්ෂාව - පාරිභෝගිකයින් සංවිධානය වී පාරිභෝගික සමිති පිහිටුවා ගෙන ඒ තුළින් ආරක්ෂාව ලබා ගැනීමයි.(කරුණු 2ට ලකුණු 2)

(ආ) 1. පොලී අනුපාතිකය 2. සංචිත අවශ්‍යතා වෙනස් කිරීම. 3. විවෘත වෙළඳපොළ කටයුතු
4. වට්ටම් අනුපාත වෙනස් කිරීම.5. ණය සීමා පැනවීම. (ලකුණු 2)

05. (i) (අ) * වාණිජ බැංකුවල පොලී අනුපාතිකය අඩුවේ.
* ආයෝජකයින් වාණිජ බැංකු මගින් ලබාගන්නා ණය ප්‍රමාණය වැඩිවේ. ආයෝජන වැඩිවේ.
* ආයෝජන වැඩිවීමෙන් නිෂ්පාදනය වැඩිවීමෙන් භාණ්ඩවල මිල අඩුවී ව්‍යාපාරවල පිරිවැටුම වැඩිවේ.
(අදාළ පැහැදිලි කිරීම් සහිත පිළිතුරට ලකුණු 2)

(ආ) * නිෂ්පාදකයාගේ නම හා ලිපිනය * නිෂ්පාදිත දිනය හා කල්ඉකුත්වන දිනය
* අඩංගු ද්‍රව්‍ය ප්‍රමාණය හා සංයුතිය. * භාවිතයට උපදෙස් හා අවවාද.
(කරුණු 4ම ඇතුළත් පිළිතුරට ලකුණු 2, ඊට අඩුනම් සුදුසු පරිදි ලකුණු දෙන්න.)

(ii) (අ) සහන් - කේවල ස්වාමි ව්‍යාපාර. පහන් - හවුල් ව්‍යාපාර. (ලකුණු 2)

(ආ)

| **සහන්** | **පහන්** |
|---|---|
| කේවල් ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
| වාසි : * තනි තීරණ ගැනීම. | වාසි : * ප්‍රාග්ධනය විශාලවීම. |
| * ඇරඹීම පහසුවීම. | * වගකීම බෙදීයාම. |
| අවාසිඃ * ප්‍රාග්ධනය කුඩාවීම. | අවාසි : * තීරණ ගැනීම ප්‍රමාද වීම. |
| * වගකීම් අසීමිත වීම. | * මතබේද |
| | * වගකීම් අසීමිතයි. |

(නම් කිරීමට ලකුණු 1/2 යි, ඉතිරි ලකුණ වාසි අවාසි වලට බෙදා දෙන්න)

(iii) (අ) වාසි : *වගකීම සීමිත වීම. *පැවැත්ම අඛණ්ඩවීම, *නෛතික පුද්ගල බව, * වැඩි පිළිගැනීම
(ආ) සංස්ථාපිත පුද්ගලික සමාගම්
(නම් කිරීමට ලකුණු 1/2යි, ඉතිරි ලකුණු 1 1/2 දෙන්න)

(iv) (අ) ලැයිස්තුගත සමාගම් සියල්ල අනිවාර්යයෙන් පොදු සමාගම් වුවද පොදු සමාගම් සියල්ල ලැයිස්තු සමාගම් නොවේ. ඊට හේතුව පොදු සමාගම් සියල්ල ලේඛනගත කිරීමක් හෝ ඊට සුදුසුකම් නොලබන හෙයිනි. (විස්තර සහිත පිළිතුරට සම්පූර්ණ ලකුණු හිමිවේ2)
(ආ) මහා පරිමාණව නිෂ්පාදනයට දායකවීම. * සේවා නියුක්තියට දායක වීම, නවීන තාක්ෂණය යොදාගත හැකිවීම, දළ දේශීය නිස්පාදනයට දායකවීම, මුල්‍ය වෙළඳපල කොටස් වෙළඳපල දියුණුවීම.
(කරුණු 4ක්වත් දක්වා ඇත්නම් ලකුණු 2)

(v) (අ)

| **පොදු හිමිකාරිත්වය** | **පෞද්ගලික හිමිකාරිත්වය** |
|---|---|
| * රාජ්‍ය සංස්ථා | * සමුපකාර |
| * රාජ්‍ය සමාගම් | * සමිති සංවිධාන |

(ලකුණු 1 බැගින් ලකුණු 2)

(ආ) * වැදගත් ව්‍යාපාර හා කර්මාන්ත අඛණ්ඩව පවත්වාගෙන යාම නිසා මහජනයාට වැදගත් සේවයක් ඉටුකරදීම.
* ජාතික නිෂ්පාදිතයට විශාල දායකත්වය
* මහජන සුබ සිද්ධියට අදාළ ව්‍යාපාර මේ යටතේ පවත්වාගෙන යාම.
* සමාජ යහපතට අදාළ අත්‍යවශ්‍ය සේවා පෞද්ගලික අංශය යටතේ පවත්වාගෙන නොයාම.
(කරුණු 4කට ලකුණු 2ක් දෙන්න)

06. (i) (අ) එක හා සමාන ආකාරයෙන් කටයුතු කරන ව්‍යාපාර ආයතන 2ක් හෝ වැඩි ගණනක් ගිවිසුමක් මත එකට එකතුවීම ව්‍යාපාර සංයෝජනයයි.
(ආ) * එක සමාන කාර්යයන්හි නිරත ව්‍යාපාර 2ක් හෝ ඊට වැඩි ගණනක් එකට එකතුවීම තිරස් සංයෝජනයකි.
උදා : සිසිල් බීම සමාගම් 2ක් එකට එකතුවීම.
ලී බඩු නිපදවන සමාගම් 2ක් එකට එකතුවීම
* එකිනෙකට වෙනස් එහෙත් යම් සම්බන්ධතාවයක් සහිත ව්‍යාපාර 2ක් හෝ වැඩිගණනක් එකතුවීම සිරස් සංයෝනයයි.
(ඉහත විස්තර උදාහරණ සහිතව දක්වා ඇත්නම් ලකුණු 2 බැගින් කොටස් 2ට දෙන්න)

(ii) (අ) * එකිනෙකා අතර තරගය අඩුවීම. * පිරිවැය පහත වැටීම. * ලාභ උපරිම වීම. * ව්‍යාපාර ස්ථාවර වීම.
* කළමණාකරණය ශක්තිමත් වීම.
(කරුණු 4ක් ඇත්නම් ලකුණු 1/2 බැගින් ලකුණු 2ක් දෙන්න)
(ආ) 1. හවුල් කරුවන් 2. අසීමිත3. නැත. 4. 2-20
5. සාමාජික මුදල් හා රජයේ අනුග්‍රහය 6. සීමිත 7. ඇත. 8. අවම 10- අසීමිත
(කරුණු 4කට 1 බැගින් 8ට ලකුණු 2)

(iii) (අ) කේවල ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, බද්ද ව්‍යාපාර.
(ලකුණු 2ම කරුණු 3ට දෙන්න. 2ක් නම් ලකුණු 1කි. 1ක් නම් ලකුනු 1/2)
(ආ) එකඟ වේ. (ලකුණු 1/2)
* විශාල ප්‍රාග්ධනයක් එක්රැස් කර ගත හැකිවීම. * නෛතික පුද්ගල බවක් හිමිවීම. *වගකීම සීමිතවීම.
* මහා පරිමාණ ව්‍යාපාර මේ යටතේ ඇරඹීම. * පිළිගැනීම.

(iv) (අ) 1. කේවල, හවුල් 2. සමුපකාර 3. හවුල් ව්‍යාපාර 4. සමාගම් (සංස්ථාපිත)(ලකුණු 2)
(ආ) 1. ගම්ලත් බේකර්ස් 2. ගම්ලත් සහ සමාගම 3. සීමා සහිත ගම්ලත් පුද්ගලික සමාගම
4. සීමිත ගම්ලත් සමාගම 5. සීමාසහිත ගම්ලත් සමාගම පී.එල්.සී
(සම්පූර්ණ නිවැරදිනම් ලකුණු 2යි, 402 ලකුණු 1, 1-2 ලකුණු1/2)

(v) වෙළෙඳපොළෙහි ඇතිවන වෙනස්කම් ව්‍යාපාර සඳහා ඇති අවස්ථාවක් ලෙස සලකන පුද්ගලයා ව්‍යවසායකයාය. ඔහුගේ ආයුධය වන්නේ නවෘතා සම්පාදනයයි.'' (ලකුණු 4)

07. (i) (අ) 1. නිර්මාණශීලී බව. 2. කැපවීම. 3. ස්වාධීනබව 4. ආත්ම විශ්වාසය
5. අවදානම් දැරීමට ඇති කැමැත්ත.(නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2, නම් කිරීමට 1)
(ආ) 1. නායකත්ව කුසලතා 2. සන්නිවේදන කුසලතා 3. අන්තර් පුද්ගල කුසලතා
4. මූලික කළමනාකරණ කුසලතා (කරුණු 4ට 1/2 බැගින් ලකුණු 2)

(ii) (අ)

| ව්‍යවසායකයා | ව්‍යාපාරිකයා |
|---|---|
| 1. නවෝත්පාදකයෙකි. | 1. සාම්ප්‍රදායිකයෙකි. |
| 2. අවදානමට මුහුණ දේ. | 2. ආරක්ෂාකාරීව කටයුතු කරයි. |
| 3. ව්‍යාපාරික ප්‍රතිවාදියා තමාමය. | 3. තවත් ව්‍යාපාරික ප්‍රතිවාදීන් ඇත. |
| 4. තම අදහස් හෝ නව සංකල්ප අනුව ව්‍යාපාර අරඹයි. | 4. පවතින අදහසක් හෝ සංකල්පයක් අනුව ව්‍යාපාර අරඹයි. |

(කරුණු 8ට 1/2 බැගින් ලකුණු4)

(iii) (අ) 1. පුද්ගලික මූල්‍යමය ප්‍රතිලාභ 2. සමාජ තත්ත්වය හා පිළිගැනීම.
3. පුද්ගල හැකියා වලින් ප්‍රයෝජන ගැනීමට හැකිවීම.
4. ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ අත්කරගත හැකිවීම. (කරුණු 4 x1/2 ලකුණු 2)
(ආ) 1. ස්වයං ඇගයීම. 2. අධ්‍යාපනය 3. පුහුණුව 4. අත්දැකීම්වලින් එල ලැබීම.
(කරුණු 4 නම්කර පැහැදිලි කිරීමට ලකුණු 2, 4 නම්කිරීමට පමණක් ල. 1)

(iv) (අ) 1. යොදවා ඇති ප්‍රාග්ධනය රු. මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර.
2. භාවිතාකරන විදුලිබල ධාරිතාව කිලෝ වොට් ඇම්පියර් 50ට අඩු ව්‍යාපාර.
3. යොදවා ඇති ප්‍රාග්ධනය රු. මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර.
4. ආයෝජිත ප්‍රාග්ධනය රු. මිලියන 20 නොඉක්මවන ව්‍යාපාර (කරුණු 4 x1/2 ලකුණු 2)

(ආ) 1. දියුණු මූල්‍ය වෙළඳපොළක් පැවතීම.
2. ව්‍යවසායකත්වයට හිතකර නීතිමය රාමුවක් පැවතීම.
3. ව්‍යවසායකත්වය දිරිගන්වන යටිතල පහසුකම් පැවතීම.
4. රට තුළ පවතින දේශපාලන හා ආර්ථික ස්ථාවර බව. (කරුණු 4 x1/2 ලකුණු 2)

(v) (අ) වාසි : 1. වැඩි ප්‍රාග්ධනයක් අවශ්‍ය නොවීම.
2. ප්‍රාදේශීය සම්පත් භාවිතය
3. රජයේ දිරිගැන්වීම් වැඩිවීම.
4. මහා පරිමාන ව්‍යාපාර යොමුනොවන අංශ වලට යොමුවීම.
5. විවෘත වෙළඳපොළක් පැවතීම.
(පිළිගත හැකි වෙනත්)
අවාසි : 1. මහා පරිමාණ පිරිමැසුම් අඩුවීම.
2. මූල්‍ය සම්පාදන මාර්ග සීමාවීම.
3. තරගකාරිත්වයට මුහුණදීමේ හැකියාව අඩුවීම.
4. තාක්ෂණය භාවිතය සීමාවීම. (පිළිගතහැකි වෙනත්)
(වැසි 2 අවාසි 2x 1/2 බැගින් ලකුණු 2)
(ආ) 1. තම කුසලතා හා හැකියා ඇගයීම.
2. ආරම්භක ප්‍රාග්ධනයහා කාරක ප්‍රාග්ධනය සපුරාගන්නා ආකාරය.
3. අමුද්‍රව්‍ය සපයාගන්නා ආකාරය.
4. සුදුසු ස්ථානයක් තෝරාගැනීම.
5. සේවකයින් සපයාගන්නා ආකාරය.
6. ව්‍යාපාර සංවිධාන ක්‍රමය.
7. තමා සතු සම්පත් අධ්‍යයනය. (කරුණු 4ට ලකුණු 2)

08. (i)

| ප්‍රමාණාත්මක සාධක | ගුණාත්මක සාධක |
|---|---|
| 1. ආයෝජිත ප්‍රාග්ධනය | 1. භාවිතා කරන තාක්ෂණය |
| 2. සේවක සංඛ්‍යාව | 2. නිමැවුමේ ස්වභාවය |
| 3. භාවිතා කරන බලශක්ති ප්‍රමාණය | 3. වෙළඳපළ ස්වභාවය |
| 4. යන්ත්‍ර උපකරණ ධාරිතාව | 4. ව්‍යාපාරයේ ස්වභාවය |

(ii) (අ) භාණ්ඩ හා සේවා හුවමාරුවේදී පොදුවේ පිළිගනු ලබන ඕනෑම දෙයක් මුදල් යනුවෙන් හඳුන්වයි.
(නිර්වචනයට ලකුණු 2)

(ආ) වර්ථමානයේ ඇතිවන ගිවිසුමකට අනුව අනාගත මුදල් ගෙවීම් සඳහා භාවිතාකළ හැකිවීම හෙවත් කල් පසුවූ ණය ගෙවීමේ හැකියාව විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස හඳුන්වයි.
(පැහැදිලි කිරීමට ලකුණු 2)

(iii) (අ) * පොදු පිළිගැනීමක් තිබීම. * කල් පැවැත්ම.
* අනුකරණයේ දුෂ්කරතාව. * පහසුවෙන් ගෙනයා හැකි වීම.
* සමජාතීය බව. * කුඩා කොටස්වලට බෙදිය හැකිවීම.
(කරුණු 4කට ලකුණු 2)

(ආ) ව්‍යවහාර මුදල් මෙන් 100% ක ද්‍රවශීලතාවක් නොතිබුනද වටිනාකමේ සංනිධියක කාර්ය ඉටුකරනු ලබන පහසුවෙන්මුදල් බවට පරිවර්තනය කළහැකි වත්කම් ආසන්න මුදල් වේ.
උදා : වාණිජ බැංකුවල මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්.
(පැහැදිලි කිරීමට ලකුනු 2)

(iv) (අ) * ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර. * ස්වංක්‍රීය තැන්පතු යන්ත්‍ර
* චෙක් තැන්පතු යන්ත්‍ර * වෙළඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල
* ටෙලි බැංකු පහසුකම් * අන්තර්ජාල බැංකු කටයුතු.
* ටෙලිවිෂන් බැංකු පහසුකම්. (කරුණු 4ට ලකුණු 2)

(ආ) * විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්. * ප්‍රාථමික අලෙවිකරුවන්
* කොටස් තැරැව්කරුවන් * ඒකකභාර
* වෙළඳපොල අතරමැදියන්. * ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්.
(කරුණු 4ට ලකුණු 2)

(v) (අ) * ඒකක භාරකරු
* අරමුදල් කළමනාකරණ සමාගම්.
* ඒකක හිමියන් හෙවත් ආයෝජකයින්.

(කරුණු 3ම සඳහන්කර ඇත්නම් ලකුණු 2යි, කරුණු 2කට ලකුණු 1)

(ආ) ***** තත්කාලීන දළ පියවීම් පද්ධතිය. (RTGS)
* ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධතිය (SSDS) /ලංකා සෙක්‍යු Lanka Secure
(නිවැරදි පැහැදිලි කිරීම් සහිත කරුණු සඳහන් කිරීමට ලකුණු 2)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440